ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/2/16/2/Common (III) වෙළුම 02 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | |
| දිනය / திகதி / Date | 2022.09.28 | | |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්,පාලන,ඉංජිනේරු සේවා,සැලසුම්)
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම ව්‍යවස්ථාපිත ආයතන,
දකුණු පළාත.

**<u>පර්යේෂණ පාදක ප්‍රතිපත්ති හා සැලසුම් ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය සහ ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා නිලධාරීන් ලියාපදිංචි කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SLIDA/RD/01/08/RR/01/2022 හා 2022.09.19 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් උක්ත කරුණ සම්බන්ධයෙන් සියලුම දීප ව්‍යාප්ත සේවා සහ අනෙකුත් විධායක සේවාවන්ට අයත් නිලධාරීන් අතුරින් සමාජයීය, ආර්ථික සහ රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී අවශ්‍ය වන සමීක්ෂණ, විශ්ලේෂණ හා පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන නිලධාරීන්ට ස්ලිඩා "පර්යේෂණ සංචිතයෙහි" ලියාපදිංචි වීමට අවස්ථාව සලසා දී ඇති බව දැනුම් දී ඇත.

03. ඒ අනුව ඉහත කරුණු පිළිබඳ ව ඔබ ආයතනයේ නිලධාරීන් දැනුවත් කර ඒ සඳහා උනන්දුවක් දක්වන නිලධාරීනගේ ජීව දත්ත උක්ත ලිපියේ දක්වා ඇති උපදෙස් ප්‍රකාර ව දී ඇති මාර්ගගත යොමුව ඔස්සේ අයදුම්පත පුරවා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත මාර්ගගතව යොමු කර අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් නිර්දේශය සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

ආර්.එච්.කමල් රණසිංහ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) ,
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.



CamScanner

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
## இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
## SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION
(Ministry of Public Services, Provincial Councils & Local Government)

තැ.පෙ. / த.பெ.இ / P.O. Box } 1123

28/10, මලලසේකර මාවත, කොළඹ 07. ශ්‍රී ලංකාව
28/10, மலலசேகர மாவத்தை, கொழும்பு 07. இலங்கை
28/10, Malalasekara Mawatha, Colombo 07. Sri Lanka

Telephone : 94 11 5980200
Fax : 94 11 2584406
E-mail : mail@slida.lk
Web : www.slida.lk


23 SEP 2022

මගේ අංකය : SLIDA/RD/01/08/RR/01/2022
දිනය : 2022.09.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**පර්යේෂණ පාදක ප්‍රතිපත්ති හා සැලසුම් ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය සහ ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා නිලධාරීන් ලියාපදිංචි කිරීම**

රාජ්‍ය ප්‍රතිපත්ති, උපායමාර්ග හා සැලසුම් සම්පාදනයේදී පර්යේෂණ ප්‍රතිඵල පදනම් කර ගැනීමේ අවශ්‍යතාවය අන් කවරදාටත් වඩා වර්තමානයේදී තීරණාත්මක වෙමින් පවතී. රාජ්‍ය කළමනාකරණයේ උන්නතිය පිණිස පර්යේෂණ සඳහා දායකත්වය සැපයීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (ස්ලිඩා) ප්‍රධාන වගකීමක් වන අතර උපදේශන, සේවාරම්භක පුහුණු හා ධාරිතා සංවර්ධන පාඨමාලාවන්හි අන්තර්ගත වන පර්යේෂණ ආශ්‍රිත අධ්‍යයන කටයුතු ද වාර්ෂිකව පළ කෙරෙන "සංවර්ධන පරිපාලනය සඳහා වන ශ්‍රී ලංකා (පර්යේෂණ) ජර්නලය [ISSN 1391-8214]" ද මෙම වගකීමට ඉරදීමෙහි ලා ස්ලිඩා ආයතනය ලබා දෙන දායකත්වයන්ට නිදසුන් වේ.

එසේවුවත්, පර්යේෂණ පාදක ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ නිපුණතා වර්ධනයද මෙහිලා වැදගත් සාධකයකි. ඒ සඳහා වන අවකාශය වඩාත් පුළුල් කරමින්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා උනන්දුවක් දක්වන රාජ්‍ය නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය පිණිස අප විසින් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. පර්යේෂණ පරිචය සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම, පර්යේෂණ පත්‍රිකා [Research Papers] ප්‍රකාශයට පත් කිරීමට සහයවීම හා ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය සමීක්ෂණ සහ විශ්ලේෂණ කුසලතා ඔප් නැංවීම ආදිය දැක්විය හැකි අතර එහි ආරම්භක පියවර වන්නේ පර්යේෂණ කෙරෙහි උනන්දුවක් දක්වන නිලධාරීන් ස්ලිඩා "පර්යේෂණ සංචිතයේ" ලියාපදිංචි කර අවශ්‍ය උපදෙස් ලබා දීමයි.

ඒ අනුව, සියලුම දිපව්‍යාප්ත සේවා සහ අනෙකුත් විධායක සේවාවන්ට අයත් නිලධාරීන් අතුරින් සමාජයීය, ආර්ථික සහ රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ දී අවශ්‍ය වන සමීක්ෂණ, විශ්ලේෂණ සහ පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන නිලධාරීන්ට ස්ලිඩා "පර්යේෂක සංචිතයෙහි" ලියාපදිංචි වීමට මේ වනවිට අවස්ථාව සලසා ඇත. එසේ ලියාපදිංචි පර්යේෂකයන්ට පහත සඳහන් ප්‍රතිලාභ හිමි වනු ඇත;

- පර්යේෂණ සඳහා ආධුනික නිලධාරීන් වෙනුවෙන් සමාරම්භක න්‍යායික පුහුණු අවස්ථා හිමිවීම
- ප්‍රායෝගික පර්යේෂණ පුහුණුව සමගින් පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීමට සහායවීම
- සිය පුද්ගලික නාමය යටතේම "පර්යේෂණ පත්‍රිකා" පළකිරීමට අවශ්‍ය මඟපෙන්වීම,
- ස්ලිඩා විසින් රාජ්‍ය ආයතන උදෙසා ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ කටයුතු සඳහා සම්බන්ධවීමට අවකාශ සැලසීම

මීට අතිරේකව, ලියාපදිංචි පර්යේෂකයන්ට පහත සඳහන් වරප්‍රසාද ද ස්ලිඩා ආයතනය විසින් ලබාදෙනු ඇත:

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ සුවිශේෂී පොත් එකතුවක් සහිත ස්ලිඩා පුස්තකාල පොත්, පර්යේෂණ ජර්නල සහ වරින්වර තිකුත් කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වාර්තා පරිශීලනය කිරීමේ අවස්ථාව
- පර්යේෂණ අංශයේ අධ්‍යයන/කාර්යාලීය අවකාශය විලාගැටීම පරිහරණය කිරීමේ අවස්ථාව

**ඉහත කරුණු පිළිබඳව ඔබ යටතේ සේවයේ නියුතු නිලධාරි මණ්ඩලවල අවධානය දල්වා පර්යේෂණ ක්ෂේත්‍රයේ ඔවුන්ගේ උනන්දුව අභිප්‍රේරණය කරමින් පර්යේෂණ නිපුණතාවන්ගෙන් පූර්ණ රාජ්‍ය නිලධාරීන්ගේ දායකත්වය ඉහළ නැංවීමට දායක වන ලෙස කාරුණිකව යෝජනා කරමි.**

එසේ උනන්දුවක් දක්වන නිලධාරීන්ගේ ජීවදත්ත මේ සමග අමුණා ඇති ආකෘතිපත්‍රය (ඇමුණුම I) අනුව පිළියෙල කර ඔබගේ නිර්දේශ සහිතව පහත දැක්වෙන ලිපිනයට (2022 සැප්තැම්බර් 30 වන දිනට ප්‍රථම) යොමුකරන මෙන් කාරුණිකව ඉල්ලමි (ලිපියෙහි වම්පස ඉහළ කෙලවරේ "පර්යේෂකයන් ලියාපදිංචි කිරීම" යනුවෙන් **සඳහන් කරන්නේ නම් මැනවි). නොඑසේනම්, අදාළ නිලධාරීන් විසින් පහත දැක්වෙන ගූගල් සම්බන්ධිතයෙන්** යොමුවන අයදුම්පත පුරවා එය මාර්ගගතව යොමුකර, එහි පිටපතක් ඔබගේ නිර්දේශය සහිතව යොමුකරන ලෙසටද අදාළ නිලධාරීන්ට දැනුම් දිය හැක (ලියාපදිංචිය පිළිබඳ විස්තර දැනගැනීම සඳහා 011 5980200 දුරකතනය විමසන්න).

> ලිපිනය: අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ අංශය), ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, නො: 28 /10, මල්ලසේකර මාවත, කොළඹ 07

මේ සඳහා ඔබගේ දායකත්වය බෙහෙවින් අගය කරමි.

**ආචාර්ය පී .ජී. ඩී ප්‍රදීපා පේරසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**

**ගූගල් සම්බන්ධිතය:**

- https://docs.google.com/forms/d/e/1FAIpQLSeu3S8dVsPdYAou5UKoLPGN1LCQmPkFB8IHkkUIZgL7Y1axJw/viewform?usp=pp_url (sandharani@slida.gov.lk යන ලිපිනය විමසීම මගින්ද මෙම ගූගල් සම්බන්ධිතය ලබා ගත හැක/ ස්ලිඩා වෙබ්පිටුව www.slida.lk ඔස්සේද අයදුම්පත මාර්ගගතව යොමුකළ හැක)

70 (...) [illegible]

S/PD/FO/09A

*"Learning Confers Discipline"*

*"To empower the Public Sector for a Better Sri Lanka Tomorrow"*

SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

Participant Registration Form

## Part 01- Contact Details

1. **Name(with initials) :**

    ........................................................................................................................

    ........................................................................................................................

2. **Highest Education Qualification:**

    ........................................................................................................................

    ........................................................................................................................

3. **Designation:**

    ........................................................................................................................

4. **Organization:**

    ........................................................................................................................

5. **Office Address:**

    ........................................................................................................................

6. **Mobile Number *( Whatsapp number)*:**

    ........................................................................................................................

CS CamScanner

## Part 02 - Subject Details

7. If you have any research publications (conference, peer reviewed, book chapter, poster) done so far please tell us how many.

.............................................................................................................

**Recommendation of the Head of the Organization**

**Director General of SLIDA**

I recommend Dr. /Mr. / Ms. ................................................................, who is working as.......................... (Post), at this institute to register at SLIDA researcher pool.

| ....................................... | ..................... | ............ |
|---|---|---|
| **Signature (Head of the Organization)** | **Stamp** | **Date** |

.................................... **Signature**

.................................... **Date**

CamScanner